# ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
## ඇබෑර්තු

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත් අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද සමඟ **2025.09.30** වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ **"පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතු ය. තමන් අයදුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතු ය. (මෙම දැන්වීම www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබාගත හැකි ය).

**සැ.යු.: තනතුරු කිහිපයක් සඳහා අයදුම්කරන අයදුම්කරුවන් එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.**

## 1. මෝටර් කාර්මික තනතුර - [පුරප්පාඩු සංඛ්‍යාව 01]

### 1.1 වැටුප් පරිමාණය

2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 51,020 – 11 x 590 / 10 x 680 – 64,310/- වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 89,000/- පමණ වේ).

### 1.2 වයස් සීමාව

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 22 ට නොඅඩු සහ 35 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ සේවය ස්ථිර කර ඇති අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

### 1.3 අධ්‍යාපන සුදුසුකම්

සිංහල/ දෙමළ භාෂාව සහ ගණිතය සඳහා සම්මාන සාමාර්ථයන් ද, ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් ද සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වී සිටීම.

### 1.4 වෘත්තීය සුදුසුකම්

ලංකා - ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය මඟින් හෝ රජයේ/ පිළිගත් පෞද්ගලික ආයතනයක් මඟින් පවත්වනු ලබන මෝටර් කාර්මික ශිල්පය පිළිබඳ වසර 3 කට නොඅඩු පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරා සාර්ථකව නිමකොට තිබීම.

සහ

සියළුම වර්ගවල වාහන පැදවීම සඳහා වලංගු රියදුරු බලපත්‍රයක් තිබීම.

***(මෝටර් කාර්මික ක්ෂේත්‍රයට අදාළව NVQ Level 4 හෝ ඉහළ මට්ටමේ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැළකේ)***

**1.5 පළපුරුද්ද**

රජයේ/පිළිගත් ආයතනයක මෝටර් කාර්මික ක්ෂේත්‍රයේ වසර පහකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

**1.6 බඳවා ගැනීමේ ක්‍රමය**

ලිඛිත පරීක්ෂණයක්, ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

**1.7 පරීක්ෂණ ක්‍රමවේදය**

(අ) <u>ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ</u>

පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් පත් කරනු ලබන අධීක්ෂක මණ්ඩලයක් මඟින් හෝ තෝරාගනු ලබන වෘත්තීය පුහුණු ආයතනයක් මඟින් ලිඛිත පරීක්ෂණයක් සහ ප්‍රායෝගික පරීක්ෂණයක් පවත්වා එහිදී පහත සඳහන් විෂය ක්ෂේත්‍රයන් ඔස්සේ අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

| **පරීක්ෂණය** | **පරීක්ෂා කරනු ලබන විෂයය ක්ෂේත්‍රයන්** | **උපරිම ලකුණු ප්‍රමාණය** |
|---|---|---|
| ලිඛිත පරීක්ෂණය | මෝටර් කාර්මික දැනුම හා නඩත්තු කටයුතු පිළිබඳ දැනුම | 100 |
| ප්‍රායෝගික පරීක්ෂණය | මෝටර් කාර්මික කටයුතු හා නඩත්තු කටයුතු පිළිබඳ ප්‍රායෝගික දැනුම හා කුසලතාව | 100 |

(ආ) <u>සම්මුඛ පරීක්ෂණය</u>

ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණයේදී පහත සඳහන් නිර්ණායක අනුව ලකුණු ලබා දෙනු ලැබේ. එහිදී ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියය (100) කි.

| **අනු අංකය** | **විෂයය ක්ෂේත්‍රය** |
|---|---|
| 1 | අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් |
| 2 | විෂය දැනුම |
| 3 | පළපුරුද්ද |
| 4 | පෞරුෂත්වය හා සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා |

## 2. සහකාර ගබඩා භාරකරු තනතුර - [ඇබෑර්තු 01]

**2.1 වැටුප් පරිමාණය:**

2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 51,020 – 11 x 590 / 10 x 680 – 64,310/- වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 89,000/- පමණ වේ).

**2.2 වයස් සීමාව:**

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නො අඩු හා අවුරුදු 40 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ සේවය ස්ථිර කර ඇති අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**2.3 අධ්‍යාපන සුදුසුකම්:**

සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය සඳහා සම්මාන සාමාර්ථයන් ද, ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් ද සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වී සිටීම.

**2.4 වෘත්තීය සුදුසුකම්:**

සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ ආයතනය (ISMM) විසින් නිකුත් කළ ගබඩා තබා ගැනීම/ ගබඩා කළමනාකරණය පිළිබඳ සහතිකයක් සහ දත්ත නිවේෂණය පිළිබඳ මූලික දැනුම ලබා තිබීම.

**2.5 පළපුරුද්ද:**

රජයේ/ පිළිගත් ආයතනයක සහකාර ගබඩා භාරකරුවකු ලෙස වසර පහකට නොඅඩු කාලයක පළපුරුද්දක් ලබා තිබීම.

**2.6 බඳවා ගැනීමේ ක්‍රමය:**

ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**2.7 පරීක්ෂණ ක්‍රමවේදය:**

(අ) ලිඛිත පරීක්ෂණය

පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් පත් කරනු ලබන අධීක්ෂක මණ්ඩලයක් මගින් හෝ තෝරාගනු ලබන වෘත්තීය පුහුණු ආයතනයක් මගින් ලිඛිත පරීක්ෂණයක් පවත්වා අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ. ලිඛිත පරීක්ෂණ සඳහා ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය 100 කි.

(ආ) සම්මුඛ පරීක්ෂණය

ලිඛිත පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණයේදී පහත සඳහන් නිර්ණායක අනුව ලකුණු ලබා දෙනු ලැබේ. එහිදී ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියය (100) කි.

| අනු අංකය | විෂයය ක්ෂේත්‍රය |
|---|---|
| 1 | අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් |
| 2 | විෂය දැනුම |
| 3 | පළපුරුද්ද |
| 4 | පෞරුෂත්වය හා සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා |

## 3. පින්තාරුකරු තනතුර - [පුරප්පාඩු සංඛ්‍යාව 01]

**3.1 වැටුප් පරිමාණය**

2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 47,240 – 9 x 540 / 10 x 590 / 3 x 680 – 60,040/- වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 85,000/- පමණ වේ).

**3.2 වයස් සීමාව**

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 40 ට නොවැඩි විය යුතුය.

**3.3 අධ්‍යාපන සුදුසුකම්**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්ව තිබීම.

(***සටහන - පින්තාරු ක්ෂේත්‍රයට අදාළව NVQ 3 සහතිකයක් හෝ ඊට ඉහළ සහතිකයක් ලබා තිබේ නම් ඉහත පරිදි අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම අනිවාර්ය නොවේ.***)

**3.4 වෘත්තීය සුදුසුකම්**

පින්තාරු/පෙදරේරු ක්ෂේත්‍රයට අදාළව NVQ 3 සහතිකයක් ලබා තිබීම.

**3.5 පළපුරුද්ද**

පිළිගත් ආයතනයක පින්තාරු ක්ෂේත්‍රයේ වසර 03 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

**3.6 බඳවා ගැනීමේ ක්‍රමය**

වෘත්තීය පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

**3.7 පරීක්ෂණ ක්‍රමවේදය**

පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් පත් කරනු ලබන අධීක්ෂක මණ්ඩලයක් මඟින් පවත්වනු ලබන වෘත්තීය පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟින් අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කෙරෙනු ලැබේ.

(අ) <u>වෘත්තීය පරීක්ෂණය</u>

මෙහිදී අයදුම්කරු සතු පින්තාරුකරණයේ ශිල්පීය දැනුම, ප්‍රවීණතාවය සහ අවශ්‍ය කුසලතා පරීක්ෂා කරනු ලැබේ. ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය සියය (100) කි.

(ආ) <u>සම්මුඛ පරීක්ෂණය</u>

සම්මුඛ පරීක්ෂණයේදී පහත සඳහන් නිර්ණායක අනුව ලකුණු ලබා දෙනු ලැබේ. එහිදී ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියය (100) කි.

| අනු අංකය | විෂයය ක්ෂේත්‍රය |
|---|---|
| 1 | අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් |
| 2 | විෂය දැනුම |
| 3 | පළපුරුද්ද |
| 4 | පෞරුෂත්වය හා සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා |

## 4. නල පවිත්‍රකරු තනතුර - [පුරප්පාඩු සංඛ්‍යාව 01]

### 4.1 වැටුප් පරිමාණය

2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 47,240 – 9 x 540 / 10 x 590 / 3 x 680 – 60,040/- වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 85,000/- පමණ වේ).

### 4.2 වයස් සීමාව

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 40 ට නොවැඩි විය යුතුය.

### 4.3 අධ්‍යාපන සුදුසුකම්

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සිංහල/ දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්ව තිබීම.

(***සටහන - ජලනල කාර්මික ක්ෂේත්‍රයට අදාළව NVQ 3 සහතිකයක් හෝ ඊට ඉහළ සහතිකයක් ලබා තිබේ නම් ඉහත පරිදි අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම අනිවාර්ය නොවේ.***)

### 4.4 වෘත්තීය සුදුසුකම්

ජලනල කාර්මික ක්ෂේත්‍රයට අදාළව NVQ 4 සහතිකයක් ලබා තිබීම.

### 4.5 පළපුරුද්ද

පිළිගත් ආයතනයක ජලනල කාර්මික ක්ෂේත්‍රයේ වසර 03 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

### 4.6 බඳවා ගැනීමේ ක්‍රමය

වෘත්තීය පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්‍ෂණයක් මඟිනි.

### 4.7 පරීක්ෂණ ක්‍රමවේදය

පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් පත් කරනු ලබන අධීක්ෂක මණ්ඩලයක් මඟින් පවත්වනු ලබන වෘත්තීය පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්‍ෂණයක් මඟින් අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කෙරෙනු ලැබේ.

(අ) <u>වෘත්තීය පරීක්ෂණය</u>

මෙහිදී අයදුම්කරු සතු ජලනලකරණයේ ශිල්පීය දැනුම, ප්‍රවීණතාවය සහ අවශ්‍ය කුසලතා පරීක්ෂා කරනු ලැබේ. ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය සියය (100) කි.

(ආ) <u>සම්මුඛ පරීක්ෂණය</u>

සම්මුඛ පරීක්ෂණයේදී පහත සඳහන් නිර්ණායක අනුව ලකුණු ලබා දෙනු ලැබේ. එහිදී ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියය (100) කි.

| අනු අංකය | විෂයය ක්ෂේත්‍රය |
|---|---|
| 1 | අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් |
| 2 | විෂය දැනුම |
| 3 | පළපුරුද්ද |
| 4 | පෞරුෂත්වය හා සම්මුඛ පරීක්‍ෂණයේ දී දක්වන කුසලතා |

## 5. ගෘහපාලන සහායක තනතුර - [පුරප්පාඩු සංඛ්‍යාව 06]

### 5.1 රාජකාරී ස්වභාවය

පාර්ලිමේන්තු සංකීර්ණයේ පිරිසිදුකම සහ සනීපාරක්ෂාව පවත්වා ගැනීම සහතික කරමින් ආහාරපාන හා සහ ගෘහපාලන සේවා දෙපාර්තමේන්තුවට අනුයුක්තව අදාළ දෛනික පිරිසිදු කිරීම් හා ගෘහපාලන රාජකාරී ඉටු කිරීම මෙම තනතුර හරහා අපේක්ෂා කෙරේ.

### 5.2 මාසික වැටුප් පරිමාණය

2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි වැටුප් පරිමාණය රු. 42,290-9x490/10x540/6x590-55,640/- වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම තනතුරට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු.80,000/- ක් පමණ වේ.)

### 5.3 වයස් සීමාව

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 30 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ තනතුරක ස්ථිර කර ඇති අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ).

### 5.4 අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් සහ පළපුද්ද

අධ්‍යාපන සුදුසුකම්: සිංහල/දෙමළ භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ද, ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ද සහිතව අ.පො.ස. (සා. පෙළ) විභාගය විෂයයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්ව තිබීම;

වෘත්තීය සුදුසුකම්: ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය (SLITHM) හෝ රජය විසින් පිළිගනු ලබන වෙනත් ආයතනයක, හෝටල් ගෘහ පාලනය, කාමර සේවක හෝ කාමර සහායක ක්ෂේත්‍රයේ මාස පහකට නොඅඩු පාඨමාලාවක සහතිකයක් ලබා තිබීම;

හෝ

හෝටල් ගෘහපාලනය, කාමර සේවක හෝ කාමර සහායක ක්ෂේත්‍රයේ NVQ level II සහතිකයක් ලබා තිබීම;

පළපුරුද්ද: අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව තරු පංතියේ හෝටලයක හෝටල් ගෘහ පාලනය, කාමර සේවක හෝ කාමර සහායක ක්ෂේත්‍රයේ වසරකට නොඅඩු පළපුරුද්දක් තිබීම.

### 5.5 බඳවා ගැනීමේ ක්‍රමය

ලිඛිත/වෘත්තීය පරීක්ෂණයකින් හා සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

(අ) <u>ලිඛිත/වෘත්තීය පරීක්ෂණය</u>

උක්ත තනතුර සඳහා අයදුම්කර ඇති අයදුම්කරුවන් අතුරින් සුදුසුකම් ලත් අයදුම්කරුවන් මෙම ලිඛිත/වෘත්තීය පරීක්ෂණයට මුහුණ දිය යුතුය. මෙහිදී හෝටල් ගෘහපාලනය, කාමර සේවය හෝ කාමර සහායක සේවය යන ක්ෂේත්‍රයන්ට අදාළව අයදුම්කරුවන්ගේ කුසලතා නිර්ණය කිරීම සිදු කරනු ලැබේ. මෙහිදී පැය 1 ක ලිඛිත/වෘත්තීය පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. එකී පරීක්ෂණය සඳහා ලබාගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය සියය (100) කි.

(ආ) <u>සම්මුඛ පරීක්ෂණය</u>

පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පහත සඳහන් නිර්ණායක පාදක කර ගනිමින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. එහිදී ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය සියය (100) කි:

| **අනු අංකය** | **විෂයය ක්ෂේත්‍රය** |
|---|---|
| 1 | අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් |
| 2 | විෂය දැනුම |
| 3 | පළපුරුද්ද |
| 4 | පෞරුෂත්වය හා සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා |

## 6. ආරක්ෂක නිලධාරි තනතුර - [පුරප්පාඩු සංඛ්‍යාව 01]

### 6.1 වැටුප් පරිමාණය:

2025.03.25 දිනැති අංක 04/2025 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 47,240-9x 540/10x 590/3 x 680- 60,040 /- වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාල අවම ආරම්භක දළ මාසික වැටුප රු.85,000.00 පමණ වේ).

### 6.2 අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද:

සිංහල හෝ දෙමළ භාෂාවට සම්මාන සාමාර්ථයක් ද, ගණිතය හා ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයන්ද සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වී තිබීම

**සහ**

වසර 10 කට නොඅඩු සම්මානනීය සේවාවක් සහිත යුධ හමුදාවේ සැරයන් හෝ ඊට නොඅඩු තත්ත්වයේ තනතුරක් දරන ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවක (නිත්‍ය) සාමාජිකයෙකු හෝ වසර 10 කට නොඅඩු සම්මානනීය සේවාවක් සහිත සැරයන් හෝ ඊට නොඅඩු තත්ත්වයේ තනතුරක් දරන ශ්‍රී ලංකා පොලිසියේ සාමාජිකයෙකු වීම

**හෝ**

අයදුම්පත් භාරගන්නා අවසන් දින වන විට පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ 'ඒ' හෝ 'බී' වැටුප් කාණ්ඩවලට අයත් තනතුරක වසර 10ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

### 6.3 වයස් සීමාව:

අයදුම්පත් භාරගැනීම අවසන් වන දිනට වයස අවුරුදු 30 ට නො අඩු හා අවුරුදු 40 ට නොවැඩි විය යුතුය. (පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

### 6.4 බඳවා ගැනීමේ ක්‍රමය:

ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

(අ) <u>ලිඛිත පරීක්ෂණය</u>

| **පරීක්ෂණය** | **පරීක්ෂා කරනු ලබන විෂයය ක්ෂේත්‍රයන්** | **උපරිම ලකුණු ප්‍රමාණය** |
|---|---|---|
| ලිඛිත පරීක්ෂණය | භාෂා හැකියාව සහ සාමාන්‍ය දැනීම | 100 |

(ආ) <u>සම්මුඛ පරීක්ෂණය</u>

ලිඛිත පරීක්ෂණය සමත් වන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, සම්මුඛ පරීක්ෂණයේදී පහත සඳහන් නිර්ණායක අනුව ලකුණු ලබා දෙනු ලැබේ. එහිදී ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියය (100) කි.

| | විෂයය ක්ෂේත්‍රය |
|---|---|
| 01 | අමතර අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් |
| 02 | විෂය දැනුම |
| 03 | පළපුරුද්ද |
| 04 | පෞරුෂත්වය හා සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා |

## 7. සේවා නියමයන් හා කොන්දේසි

(i) මෙම තනතුරු ස්ථිරය. මෙම තනතුරු වලට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතුය. තෝරාගනු ලබන අයදුම්කරුවන් මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත්කරනු ලබයි. රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත, තනතුරක සේවය කරනු ලැබූ අයදුම්කරුවකු හෝ පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්යය මණ්ඩලයේ සේවයේ ස්ථිර කරනු ලැබූ අයදුම්කරුවකු තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය වසරක (01) වැඩ බැලීමේ කාලයකට යටත්ව පත්කරනු ඇත.

(ii) පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පාර්ලිමේන්තුවේ මහ ලේකම්ට බලය ඇත.

(iii) තෝරාගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

(iv) තෝරාගනු ලබන අයදුම්කරුවන්, වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදලට ඔහුගේ/ඇයගේ වැටුපෙන් රජය විසින් තීරණය කරනු ලබන ප්‍රතිශතයකින් දායකත්වය ලබා දිය යුතුය.

(v) තෝරාගත් අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය.

(vi) තෝරාගත් අයදුම්කරුවන් පත්කිරීමට පෙර ඔහු/ඇය පිළිබඳව ආරක්ෂක නිෂ්කාශන වාර්තාවක් ලබා ගැනීම සිදු කරනු ඇත.

8. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) සිය අයදුම්පත්වලට ඇමිණිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(අ) ජාතික හැඳුනුම්පත
(ආ) උප්පැන්න සහතිකය.
(ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික.
(ඈ) වෘත්තීයමය සුදුසුකම් සනාථ කෙරෙන සහතික
(ඉ) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික.

9. මෝටර් කාර්මික තනතුර සඳහා පමණක් ඉහත 8 (අ) සිට (ඉ) දක්වා සහතික වලට අමතරව සියළුම වර්ගවල වාහන පැදවීම සඳහා වලංගු රියදුරු බලපත්‍රයක පිටපතක් ද ඇමිණිය යුතුයි.

10. රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ සේවය කරන අයදුම්කරුවන්, සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවිය යුතුය. ආරක්ෂක නිලධාරි තනතුර සඳහා අයදුම් කරන සන්නද්ධ හමුදාවල සහ පොලීසියේ සේවය කරන අයදුම්කරුවන් ද, සිය අයදුම්පත් අදාළ ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානියා හරහා එවිය යුතු ය.

11. තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

12. අයදුම්පත්‍රයෙහි සඳහන් වන කවර කරුණක් හෝ වැරැදි යැයි යමකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

13. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ, සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් හරහා යොමු කරනු නොලබන හෝ ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙළ නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**කුෂානි රෝහණදීර**
පාර්ලිමේන්තුවේ මහ ලේකම්

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ

2025 සැප්තැම්බර් මස ----- වැනි දින

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**

# ආදර්ශ අයදුම්පත්‍රය

## ඇබෑර්තු - 2025

---

**------------------------------------------------------------------- තනතුර**

1. (අ) මුලකුරු සමඟ නම (සිංහලෙන්) : ..................................................................

   (ආ) මුලකුරු වලින් හැඳින්වෙන නම (සිංහලෙන්) : ..................................................................

   (ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : (මහතා/මහත්මිය/මෙනවිය) ..........................................

2. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

3. (අ) (i) පෞද්ගලික ලිපිනය : ........................................................................................................

   ........................................................................................................

   ........................................................................................................

   (ii) විද්‍යුත් තැපැල් ලිපිනය (E-mail) : ..................................................................

   (iii) දුරකථන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

   (iv) Whatsapp දුරකථන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

   (ආ) (i) කාර්යාලයීය ලිපිනය : ..................................................................

   ........................................................................................................

   ........................................................................................................

   (ii) දුරකථන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

   (ඇ) විභාග ප්‍රවේශ පත්‍රය යොමු කළ යුතු ලිපිනය සඳහන් කරන්න.

   පෞද්ගලික ☐ රාජකාරී ☐

4. (අ) උපන් දිනය : වර්ෂය ............... මාසය............... දිනය ...............

   ***(උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා තිබිය යුතු ය)***

   (ආ) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස : අවුරුදු ............... මාස ............... දින ...............

5. විවාහක/අවිවාහක බව : ..........................................................................

6. ස්ත්‍රී /පුරුෂ භාවය : ..........................................................................

7. ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද යන බව : (ඔව්/ නැත)

8. අධ්‍යාපන සුදුසුකම් (***සහතික පිටපත් අමුණා තිබිය යුතු ය***)

| විභාගය | විෂයයන් | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|---|
| අ.පො.ස. (උ/ පෙළ) | | | |
| | | | |
| | | | |
| | | | |
| අ.පො.ස. (සා/ පෙළ) | සිංහල / දෙමළ | | |
| | ගණිතය | | |
| | ඉංග්‍රීසි | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

9. වෘත්තීය සුදුසුකම් (***සහතික පිටපත් අමුණා තිබිය යුතු ය)***

| පාඨමාලාව | ආයතනය | ක්‍රියාත්මක වන දිනය<br>**(Effective date)** |
|---|---|---|
| | | |
| | | |
| | | |

10. වෙනත් සුදුසුකම් (***සහතික පිටපත් අමුණා තිබිය යුතු ය***)

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

11. පළපුරුද්ද (***සහතික පිටපත් අමුණා තිබිය යුතු ය)***

| ආයතනය | තනතුර | සේවා කාල සීමාව |
|---|---|---|
| | | |
| | | |
| | | |

12. වත්මන් රැකියාව පළිබඳ විස්තර ***(අදාළ ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය)***

(අ) ආයතනයේ නම : ........................................................................

(ආ) ආයතනයේ ලිපිනය : .........................................................................

(ඇ) මුල් පත්වීමේ දිනය : .........................................................................

(ඈ) දැනට දරන තනතුර : .........................................................................

(ඉ) මාසික මූලික වැටුප : .........................................................................

(ඊ දීමනා : .........................................................................

(උ) දළ වැටුප : .........................................................................

13. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියක දී වැරදිකරු වී ඇත්ද? (ඔව්/ නැත)

එසේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න : ..........................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

14. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේද? (ඔව්/ නැත)

එසේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න : ............................................................................

............................................................................................................................................

*ම විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුසුස්සකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත් වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමටත් හේතු වන බව දනිමි.*

දිනය : ................................. ............................................................

අයදුම්කරුගේ අත්සන

දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ නිර්දේශය

**රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.**

පාර්ලිමේන්තුවේ මහ ලේකම්,

මෙම ආයතනයේ ....................................... තනතුර දරන ....................................................... මයා/මිය/මෙනෙවියගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම තනතුරෙහි ස්ථිර කර ඇති/නොමැති බවත්, ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, ඔහුට හෝ ඇයට එරෙහිව විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, එවැනි කරුණක් පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. (කරුණාකර අනවශ්‍ය වචන කපා හරින්න)

දිනය : .................................... ……….................................................

දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ අත්සන

(නිල මුද්‍රාව)